# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය

SINHALA

ECHO OF HIS CALL 1969-2019 GOLDEN JUBILEE (ECHO GROUP)

India's National Spiritual Newspaper

₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

Editor : S. SAM SELVA RAJ

16 Languages

Vol. XVI | NOVEMBER 2022 | Issue No. 12


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 77:1-11)**

01. මාගේ හඬින් දෙවියන්වහන්සේට, එසේය, මාගේ හඬින් දෙවියන්වහන්සේට මොරගසන්නෙමි, උන්වහන්සේ මට කන්දෙනසේක.

02. දුක් ඇති දවසේදී ස්වාමීන් සෙව්මී. රාත්‍රීයේදී මාගේ අත නොනැවතී දිගුකර තිබුණේය, මාගේ ආත්මය සැනසෙන්ට අකමැතිවිය.

03. මම දෙවියන්වහන්සේ සිහිකොට චංචලව සිටිමි. මම මෙනෙහිකරමි, මාගේ ආත්මයද ශෝකයෙන් පිරී ගියේය.

04. ඔබ මාගේ ඇස්වලින් නින්ද වලක්වනසේක. කථාකරන්ට බැරි තරම් කැළඹී සිටිමි.

05. මම පුරාණයේ දවස්ද පූර්ව කාලවල අවුරුදුද කල්පනාකලෙමි.

06. රාත්‍රීයේ මාගේ ගීතිකාව සිහිකොට,මාගේම සිත සමඟ කථාකරමි, මාගේ ආත්මයද ඕනෑකමින් විමසුවේය.

07. ස්වාමීන්වහන්සේ සදාකාලේටම පහකරනසේක්ද, තවත් කරුණා නොකරනසේක්ද?

08. උන්වහන්සේගේ දයාව සහමුලින්ම පහව ගියේද? උන්වහන්සේගේ පොරොන්දුව සදාකල් ඉෂ්ට නොවන්නේද?

09. දෙවියන්වහන්සේ කරුණාකරන්ට මතකනැතිකලසේක්ද? කෝපයෙන් ස්වකීය දයාව වැලැක්වූ සේක්ද?

10. එවිට මම කථාකොට, මේ මාගේ දුර්වලකමය, නුමුත් මහෝත්තමයාණන්ගේ දකුණාතේ අවුරුදු සිහිකරන්නෙමි.

11. ස්වාමීන්ගේ ක්‍රියා සඳහන් කරන්නෙමි, මක්නිසාද ඔබගේ පුරාණ ආශ්චර්යයන් සිහිකරන්නෙමි.

# ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරනසේක.

## THE LORD WILL BLESS YOU ALSO!

*"...නුඹට පිහිටවන නුඹේ පියාගේ දෙවියන්වහන්සේ ගෙන්ද ඉහළ අහසේ ආශිර්වාදවලිනුත් පහළ වැතිර තිබෙන ගැඹුරේ ආශිර්වාද වලිනුත් පායෝධරවල සහ ගර්භයේ ආශිර්වාද වලිනුත් නුඹට ආශිර්වාද කරන සර්වපරාක්‍රමයාණන් වහන්සේගෙන්ද ඔහුගේ අත්වල ශක්තිය ස්ථිරකරන ලද්දේය." (උත්පත්ති 49:24-25)*



(කැ. ප්‍ර. සේවයේ 54 වන සංවත්සරයේදී පාස්ටර් එස්. ආබ්‍රහම් විසින් දුන් පණිවිඩයකි)

උත්පත්ති 49 වන පරිච්ඡේදය දෙස බලව විටදී අපට පෙනීයන්නේ, අපගේ මුල් පියවරු වූ යාකොබ් මිය යාමට ප්‍රථම තම දරුවන් 12 දෙනාහට දුන්නාවූ දෙවියන්වහන්සේගේ ආශිර්වාදයේ ප්‍රකාශයයි. ' යෝසෙප්' යන නමෙහි අර්ථව නම්, 'වැඩි වර්ධනයවීමයි' ඉහත සඳහන්කරන ඇති ***උත්පත්ති 49: 24-25*** යන පද තුළ යෝසෙප්ට දුන් ආශිර්වාදයන් ගැන සඳහන්ව ඇත. මෙහිදී අපට ආශිර්වාද 4 ක් සඳහන් කර තිබේ.

(i). ස්වර්ගයෙන් පැමිණෙන ආශිර්වාදය
(ii). ගැඹුරෙන් පැමිණෙන ආශිර්වාදය
(iii). මවගේ පායෝධරවලින් ලැබෙන්නාවූ ආශිර්වාදය
(iv). මවගේ ගර්භයෙන් ලැබෙන්නාවූ ආශිර්වාදය,

එනම් මෙහිදී පරම්පරාවන් කීපයක් ඇති කිරීමට පුළුවනි. දරුවෙක් මේ ලෝකයට බිහි කිරීමේදී වේදනාවක් ඇතිවුවත් එම දරුවාගේ උපත තුළින් පරම්පරාවන් බොහොමයක් ඇති වෙයි.

## ස්වර්ගීය ආශිර්වාදය

ස්වර්ගයෙන් පැමිණෙන්නාවූ ආශිර්වාදයක් ඉතාම අනර්ඝයි. සැම දරුවෙක්ම මෙම ආශිර්වාදය අත්දැකිය යුතුය. අපගේ මුල් පියෙක් වූ ඊසාක් තම පුතාට ආශිර්වාද කල කල්හි පළමුකොට ඔහුට දුන්නේ ආත්මික ආශිර්වාදයන්ය. ***"එබැවින් දෙවියන්වහන්සේ අහසේ පිනිද පොළොවේ සාරත්වයද බොහෝ ධාන්‍ය හා මිදියුසද නුඹට දෙන සේකවා." (උත්පත්ති 27:28)*** මෙම ආශිර්වාද දෙස

3 වෙනි පිටුවට ...

ECHO OF HIS CALL - (1969-2019 GOLDEN JUBILEE YEAR)



## from your dearly beloved brother...

(ECHO GROUP)



# කැඳවීමේ ප්‍රතිරාවය

> "ස්වාමීන්වහන්සේ ස්වකීය මුහුණ නුඹ කෙරෙහි ඔසවා නුඹට සමාදානය දෙන සේක්වා." (ගණන් කථාව 6:26)

**ක්‍රිස්තුස්වහන්සේ යේසුස්වහන්සේ තුල ප්‍රිය මිත්‍රවරුනි,**

අපගේ ස්වාමීවූ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ ප්‍රේමයේ නාමයෙන් අප ඔබට සුභ පතමි.

දෙවියන්වහන්සේගේ අනුග්‍රහය කරණකොටගෙන 2022 වන වර්ෂයේ අවසානය කෙරෙහි අප ළඟා වෙමින් සිටිමු. ලෝකයේ බොහෝ දෙනා යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උපත සිහි කිරීමටත් 2023 වන වසර පිළිගැනීමටත් දැන් සිටම සූදානම්ව සිටිති. අප ආත්මික සෙනඟක් ලෙස මෙම දවස් ආත්මික දේ කිරීම පිණිස පාවිච්චි කරමු. අප යාච්ඤාවට හා දේව සේවය කිරීම පිනිස වැඩි කාලයක් ලබා දෙමින් සැබෑ දේව දරුවෙක් ලෙස ක්‍රියා කල යුතුය.

කාසියක පැති දෙකක් තිබෙන්නාක් මෙන් යාච්ඤාව හා සේවය යන කාරණා අපගේ ජීවිතයෙහි තිබිය යුතුය. බොහෝ අය අද සේවයේදී ඉතා කඩිසරව සිටින නමුත් යාච්ඤාව අත්හැර ඇත. යාච්ඤාව අමතක කිරීම අපව ආත්මික ලෙස වැටීමටත් පසුබට වීමටත් මගපෙන්වයි.

අද උදෑසන දෙවියන්වහන්සේ මගේ හදවතට දැමූ කාරණායක් මා ඔබත් සමඟ බෙදා ගැනීමට කැමැත්තෙමි.

අප සහභාගීත්වය පවත්වන්නාවූ විට සමහර අවස්ථාවන් වලදී අප අතර තිත්ත හැඟීම් ඇතිවෙනවා ඇත. අප පරිපූර්ණ මනුෂ්‍යයන් නොවන මුත් අප දිනපතා අපගේ සිතුවිලි වලින් අලුත්වන සම්පූර්ණත්වය කරා ගමන් කරන්නාවූ සෙනඟකි. අප ශුද්ධාත්මයාණන්වහන්සේට විවෘත වෙනවා නම්, දෙවියන්වහන්සේ සමහර පුද්ගලයින්ව පාවිච්චි කරමින් අපව පවිත්‍ර කිරීම කරනු ලබයි. නමුත් නිතරම යාච්ඤා කරනුනාවූ සෙනඟක් කිසි විටකත් සැකයටත් කෝපයටත් ඔවුන්ගේ ජීවිතයේ ඉඩ දෙන්නේ නැත.

යාච්ඤාව නැති කල්හි අපි එකිනෙකාට විරුද්ධව කථා කිරීමටත් ක්‍රියා කිරීමටත් පොළඹයි. යාච්ඤාව නැති තැනැත්තාගේ ජීවිතයෙහි පසුබටවීම ඉතාම පහසුවෙන් සිදුවෙයි. පාවුලුතුමා, සහභාගිකමේදී ඇතිවෙන්නාවූ අභියෝග හා ප්‍රශ්න ගැන අපට පැහැදිලිවම කථා කරයි. එම නිසා සභාවේ සෙනඟ නොකඩවාම යාච්ඤා කල යුතුයි කියා පවසයි. ඔහු තිමෝතිට මෙම වගකීම භාරදුන්නේය. මෙම අපෝස්තුළුවරයා සභාව සමඟ ගනුදෙනු කරන විට ඔහු දුටු කාරණයක් නම්, යාච්ඤාව අඩුවන විටදී සභාව තුළ ප්‍රශ්න හා අසාමාදාන තත්වයක් ඇතිවන බවයි. ඔහු මෙය ඉතා හොඳින් වටහා ගත්තේය. එම නිසා ඔහු යාච්ඤාව සම්බන්ධව මුල් සභාව තුළ ක්‍රියා කරනු ලැබුවේය. ***(ක්‍රියා 6:34)***



***Key Leaders of our ministry in Chennai***

### OUR MISSION POLICY

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**CHIEF EDITOR**
**Angeline Selvakumari Henry,** M.A., M.Ed.

**MANAGING EDITOR**
**Pastor Alex Samson Sam,** B.Th., M.Div.

**ADMINISTRATION**
**Bro. N. Prakasam,** M.A., General Manager

**EDITORIAL BOARD**
**Sis. Jesy Veena Sam**
**Sis. Serena Bevin,** M.A., M.Phil., B.Ed.
**Rev. Dr. K.R. Rajasekaran**
**Dr. A. Richard Samuel,** M.A., Ph.D.



**EDITOR, PUBLISHER & PRINTER**
**Pastor S. SAM SELVA RAJ**
**Echo of His Call Printers**
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
**Phone : (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**
**Cell : (+91) 98410 71852, 95661 31858**



**CORE LEADERS**
**Bro. K. Puratchivendan**
**Bro. A. Edward Durai**
**Bro. A. Alvin**
**Bro. K. Abraham**
**Sis. Dhanalakshmi Chinnaiah**



**E.mail ID**
sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**
www.echoofhiscall.org
www.stpaulsmatriculation.com

**YOUTUBE CHANNEL**
Echo of His Call


**Our Ministries:** ☼ ECHO OF HIS CALL Monthly Magazines (16 languages) ☼ BIBLECOR - Postal Courses (3 languages) ☼ Online Courses ☼ Theological Correspondence Courses (2 languages) ☼ Church Planting ☼ Nehemiah Bible Colleges ☼ Gospel Printing Press ☼ Great Commission Partners ☼ St. Paul's Matriculation School ☼ Crusades ☼ Community Development

යාච්ඤාව නැතිවන කල්හි ශුද්ධකමද නැතිවෙයි. සියලු පාපිෂ්ඨ වූ දේ සිදුවෙයි. තෘෂ්ණාවේ ඇස්, මාංසයේ තෘෂ්ණා හා ජීවිතයේ උඩඟුකම් පැමිණ අපගේ පුද්ගලික ගැලවීමද විනාශකර දමයි. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය විශාලයි. නමුත් මේ ශරීරය තුළ එකිනෙකාට දොස් කීම, කෙඳිරීම, වැරදි සෙවීම, දොස් පැවරීම වැනි දේ වර්ධනය වීමට ඉඩදිය නොහැක. යාච්ඤාව නැතිකල තිත්තකමේ එල අපට දැකගත හැකිය. මේ සියල්ල සිදුවන්නේ මනුෂ්‍යයන් යාච්ඤා නොකරන විටදීය. සහභාගීත්වයන් අසාර්ථක වන්නේද යාච්ඤාව නැති විටදීය. අපගේ ජීවිතයේ ආත්මික ප්‍රතිඵලයක් විය යුත්තේ යාච්ඤාවයි. අපගේ සේවයෙහි සිටින සියලුම නායකයින් උදෙසා චෙන්නෙහි නුවරහිදී විශේෂ යාච්ඤා හා සහභාගිත්වයක් සැප්තැම්බර් මස 22 වන දින සවස 5.00 සිට පවත්වනු ලැබීය. ස්වාමීන්වහන්සේ ඔබට ආශිර්වාද කරන සේක. සහෝදරයිනී අප උදෙසා

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුල ඔබගේ සේවක**

**පාස්ටර් සෑම් සෙල්වරාජ් සහ ඇලෙස්ත් සැම්සන් සෑම්**

(+91) 98412 71858 / 98410 71858, E.mail : samselvaraj333@gmail.com


***1 පිටුවෙන්....***

බලන විටදී දැකීම හැකි දෙය නම් ඊසාක් ප්‍රකාශකල සෑම ආශිර්වාදයක්ම දෙවියන්වහන්සේ යාකෝබ්ට දුන් ආකාරයයි. උත්පත්ති 1:1 හි පවසා ඇති ආකාරයට, ***''පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත් පොළොවක් මැවූ සේක.''*** යන්නයි. මෙහිදී දෙවියන්වහන්සේ පවසන ආකාරයට පළමුකොට උන්වහන්සේ 'අහස' මැවූ සේක. එනම්, දෙවියන්වහන්සේ 'අහසට' ප්‍රමුඛස්ථානය දුන් සේක. දෙවියන්වහන්සේ විසින් ආබ්‍රහම්ට දුන් පොරොන්දු ඔහු සැකකල විටදී දෙවියන්වහන්සේ ආබ්‍රහම්ට පිටතට පැමිණෙන්න කියා පවසමින් අහස දෙස බලා බලන්නය කියා පැවසුවේය.



***'උන්වහන්සේ ඔහු පිටතට කැඳවා, අහස දෙස බලා තාරකා ගණන්කල හැකි නම් ඒවා ගණන් කරපන්නැයි කීසේක, නුඹේ වංශයද එසේම වන්නේයයි ඔහුට කීසේක.'' (උත්පත්ති 15:5)***

මේ ලෝකයේ ජීවිතයේදී අපි වෙහෙසට පත් වූ විටදී අපගේ දුක ප්‍රීතියට හැරෙයි. මන්ද දෙවියන්වහන්සේගේ ස්වර්ගීය ආශිර්වාදයන් අප සමඟ තිබෙන්නේය. කුඩා දරුවෙක් යේසුස්වහන්සේ වෙතට පැමිණ රොටී පහක් සහ මාලු දෙදෙනෙක් උන්වහන්සේට දුන්නේය. එම කෑම යේසුස්වහන්සේ දුන් විටදී ඒ කෑම තුළින් 5000 කට වඩා වැඩි සෙනඟකට ආශිර්වාදයක් විය. මෙම කුඩා දරුවා දුන් කෑමෙන් සෙනඟ දහස් ගණනක්ගේ කුසගින්න නිවුනේ කෙසේද? මෙම හාස්කම සිදුවූයේ කෙසේද?. එයට එකම හේතුව නම් යේසුස්වහන්සේ



එම කෑම රැගෙන ස්වර්ගය දෙසට ඔසවා ස්වර්ගීය ආශිර්වාදය ලබා ගනිමින් මෙම හාස්කම සිදු කලේය.

යේසුස්වහන්සේගේ සෑම සේවයකදීම උන්වහන්සේ හැමවිටම ස්වර්ග දෙසට තම නෙත් යොමුකලේය. ස්වර්ගීය ආශිර්වාදය, දෙවියන්වහන්සේ වාසය කරන්නාවූ ස්ථානයේ සිට උන්වහන්සේගේ බලය අප වෙතට රැගෙන එන්නේය. දෙවියන්වහන්සේගේ මහිමය නිසා කුඩා දරුවා දුන් ආහාරයට දෙවියන්වහන්සේගේ බලය පැමිණ එය දහස්ගණනක සෙනඟකට ආශිර්වාදයක් විය.

මෙලෙස ස්වර්ගීය තේජස පැමිණුනාවූ තවත් සිදුවීමක් මා ඔබහා බෙදාගැනීමට කැමැත්තෙමි. වරක් යේසුස්වහන්සේ වෙතට ගොළු සහ බිහිරි පුද්ගලයෙක්ව ගෙන ආවේය. ***''උන්වහන්සේ රහසින් ඔහු සමූහයා කෙරෙන් අහකට ගෙන ගොස්, ඔහුගේ කන්වල තමන්ගේ ඇඟිලි බහා, කෙළගසා, ඔහුගේ දිව ස්පර්ශකොට, ස්වර්ගය දෙස බලා, සුසුම්ලා, එප්ඵාතා, එනම් ඇරේවයි ඔහුට කීසේක.'' (මාර්ක් 7:33-34)*** ලාසරුස් අසනීපවූ විටදී යේසුස්වහන්සේට ඔවුන් ආරාධනා කළ මුත් ඔහු මියයන තෙක් යේසුස්වහන්සේ එහි ගියේ නැත. ඔහු මියගොස් දින 4 කට පසුව යේසුස්වහන්සේ එහි ගියේය. ලාසරස් යේසුස්වහන්සේගේ හොඳම මිත්‍රයා වුවත් ඔහු මියගොස් දින 4 කට ඔහුගේ ශරීරයෙන් දුගඳ හමන විටදී යේසුස්වහන්සේ එහි ගියේය. ***(යොහාන් 11:39) යොහාන් 11:41-42 දක්වා පදවල මෙසේ පවසයි, ''...යේසුස්වහන්සේ ඇස් ඔසවා, පියාණෙනි, ඔබ මාගේ වචන ඇසූ නිසා ඔබට ස්තුති කරමි. ඔබ නිතරම මාගේ වචන අසන බව දැනගෙන සිටියෙමි...''*** උන්වහන්සේ ඉහළින් බලය හා ආශිර්වාදය ලබාගත් පසුව උන්වහන්සේ ශබ්ධ නඟා, **''...ලාසරුස් පිටතට වරෙන්නැයි මහත් ශබ්ධයකින් කීසේක.'' (යොහාන් 11:43)** ලාසරස්ගේ ශරීරය නරක්වී දුගඳක් හැමුවත් ඔහු ජීවමානව පිටතට ආවේය. ප්‍රශ්නය කොපමණ විශාලවුවත් යේසුස්වහන්සේට එය ඉතා සුළු දෙයකි. උන්වහන්සේ හැම ප්‍රශ්නයකටම වඩා සර්වබලධාරීය, උන්වහන්සේ බලවත් දෙවියන්වහන්සේය. ඔබ මුහුණදෙන්නාවූ ප්‍රශ්නය කොපමණ විශාලවුවත් ස්වර්ගීය ආශිර්වාදය පැමිණෙන කල්හි එයට විසඳුම ලැබෙයි. ***''ඉශ්‍රායෙල් පුත්‍රයන්ගේ මුළු සභාව ස්වාමීන්වහන්සේගේ ආඥාව ලෙස ඕසීන් වනාන්තරයේ සිට ක්‍රමයෙන් ගමන්කොට රෙෆීඩම්හි***

***කඳවුරු බැඳගත්තාය... එහිදී සෙනඟට වතුර පිපාසවිය. ඔවුන් මෝසෙස්ට විරුද්ධව කොඳුලෝය. මෝසෙස් ස්වාමීන්වහන්සේට මොරගසා...'' (නික්මයාම 17:1-4)*** එම වියළි පලාතට ස්වර්ගීය ආශිර්වාදය පැමිණුනේය. පර්වතයෙන් වතුර පැමිණුනේය. ***(නික්මයාම 17:5-6)*** යාකෝබ් බෙයර්ශෙබා හා සිට හාරාත්ට ගමන්කරන විටදී රාත්‍රියේදී ඔහුට නවාතැන් ගැනීමට ස්ථානයක් නොමැතිව, ඇඳක් හෝ කොට්ටයක්වත් නොමැතිව ඔහුගේ හිසට ගලක් තබාගෙන නිදාගත්තේය. ඔහු ඔහුගේ අනාගතය ගැන කිසිවක් නොදැන මානසික පීඩනයකින් යුතුව නිදාගත් අවස්ථාවේදී ඔහු සිහිනයක් දුටුවේය. ***''...පොලොවෙහි තබන ලද හිණිමගක් විය. එහි මුදුන අහස දක්වා විය. දෙවියන්වහන්සේගේ දූතයෝ එහි නගිනමිද බසිමින්ද සිටියෝය...'' (උත්පත්ති 28:12-13)***

එක්තරා දේව දාසයෙක් ඔහුට ලැබුණාවූ හැම මුදලක්ම රැ ගෙන මනුෂ්‍යයන් 5000 ක් පමණ අසුන්ගැනීමට හැකි දේවස්ථානයක් ගොඩනැගුවේය. නමුත් ඊට මාස කීපයකට පසුව අති මහත් කුණාටුවක් පැමිණ එම මුළු ගොඩනැගිල්ලම බිමට කඩා වැටුනේය. එම අවස්ථාවේදී ඔහු දෙවියන්වහන්සේට ස්තුති කලේය. ඔහුට ඉතා මහත් වේදනාවක් දැනුනි, සෙනඟද ඔහුව සමච්චලයට පත් කරමින් විහිළු කලේය. නමුත් ඔහු දෙවියන්වහන්සේ තුළ ස්ථිරවම සිටියේය. සමහර පුද්ගලයන් පැමිණ 'ඔබ අපේ දේවස්ථානයට පැමිණ දේශනාකරන්නය' කියා ඔහුව සනසන පිණිස ප්‍රකාශ කලේය. මාස ගණනාවක්ම සැනසීම ලැබෙන පිණිස මෙලෙස දේශනා කලේය. ඔහු ගමන්කල සෑම ස්ථානයකදීම දෙවියන්වහන්සේගේ මහිමය සෙනඟ දුටු බැවින් බොහෝ දෙනෙක් මෙහි පැමිණෙන්නට පටන්ගත්තේය. බොහෝ දෙනෙක් ගැලවීම ලැබුවේය. දිනක් ඔහු ලක්ෂ 2 කට පමණ දේශනාකරන විටදී ඔහුට නිහඬ හඬක් එනම්, දෙවියන්වහන්සේගේ පැහැදිලි හඬක් මෙලෙස ඇසුනි. එනම්, ''මට අවශ්‍ය වූයේ නුඹ 5000 කට සේවය කිරීමට නොවෙයි. එම නිසා ඔබගේ ගොඩනැගිල්ල විනාශවුනා. මට අවශ්‍ය වූයේ නුඹ දහස් ගණනකට නොව ලක්ෂ ගණනකට සේවය කිරීමයි.''

කුරුල්ලන් පියඹා යන පිණිසත් උන්ගේ කෑම සපයාගන්නා පිනිස පියඹා යන පිණිසත් දෙවියන්වහන්සේ උන්ගේ කූඩුව කඩා දමනු ලබයි. යාකෝබ් දුටු දර්ශනයේදී ඉණිමග මුදුනෙහි ස්වාමීන්වහන්සේ සිටින ආකාරය දුටුවේය. මේ ගැන අප යොහාන් 1:51 හි මෙසේ සඳහන්ව ඇත. ***''තවද උන්වහන්සේ, සැබෑවක් සැබෑවක් නුඹලාට කියමි. ස්වර්ගය විවරව, දෙවියන්වහන්සේගේ දූතයන් මනුෂ්‍ය පුත්‍රයා කෙරෙහි නගිනවා සහ බසිනවා නුඹලා දකිනවා ඇත.''*** යාකෝබ් දුටු ඉණිමග නම්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේය. යේසුස්වහන්සේ නැමති ඉණිමග කරණකොට ගෙන ඔබගේ යාච්ඤාව සර්වබලධාරී දෙවියන්වහන්සේ වෙතට යන්නේය. එවිට යාච්ඤාවට පිළිතුරු පහළට බැස එනවා ඇත. ***''උන්වහන්සේගේ හිසද හිසකේද සුදු ලොම් සහ හිම මෙන් සුදුය, උන්වහන්සේගේ ඇස් ගිනිදැල්ලක් හා සමානය, උන්වහන්සේගේ පාද උඳුනක ගිනියම්කල දිලිහෙන පිත්තල මෙන්ය, උන්වහන්සේගේ ශබ්දය බොහෝ ජල ඝෝෂාවක ශබ්දය මෙන්ය, උන්වහන්සේ ස්වකීය දකුණතෙහි තාරකා සතක් ඇතිව සිටි සේක...'' (එළිදරව් 1:14-16)*** යේසුස්වහන්සේගේ මුහුණ දිළිසෙන්නාවූ සූර්‍යයා මෙන් තිබුණි. උන්වහන්සේ අප උදෙසා ඉණිමගක් විය. උන්වහන්සේ සෑම විටම අපව ආරක්ෂා කිරීම පිනිස අප සමග සිටියි. ''බලව, උන්වහන්සේ මා ළඟින් යන නමුත් මට පෙනෙන්නේ නැත. මා පසුකර යන නමුත් මට දැනෙන්නේ නැත.'' (යෝබ් 9:11) උන්වහන්සේ අප සමඟ ජීවත්වන විට ස්වර්ගීය ආශිර්වාද අපට දීමට සූදානම්ව සිටී.

## (2). භූමික ආශිර්වාදය

අපට ස්වර්ගීය ආශිර්වාදය ලබෙන්නාවූ ආකාරයටම උන්වහන්සේ භූමික ආශිර්වාදයන්ද අපට ලබා දෙන්නේය. භූමික ආශිර්වාද අපට ඉතා වැදගත්ය. ***''උන්වහන්සේ සීනයි කන්ද පිටදී මෝසෙස් සමඟ කථාකර කෙළවරවූ කල දෙවියන්වහන්සේගේ ඇඟිල්ලෙන් ලියන ලද ගල්ලෑලි වූ සාක්ෂියේ ලෑලි දෙක ඔහුට දුන්සේක.'' (නික්මයාම 31:18)*** මෝසෙස්ට ස්වර්ගීය ආශිර්වාදයන් ලැබුණු පසුව



ස්වාමීන්වහන්සේගේ අතින් ගල්ලෑලිවල ලියනු ලැබූ ව්‍යවස්ථාව ඔහු රැ ගෙන ආවේය. එය භූමික ආශිර්වාදයයි. සීනයි කන්දේදී ලැබූ මේ භූමික ආශිර්වාදය සෙනඟට මඟපෙන්වීමට අවශ්‍ය විය. මෝසෙස් සීනයි

6 වෙනි පිටුවට....

**Pray for NEHEMIAH BIBLE**
**RESIDENTIAL / EVENING COLLEGE,**
Velachery / Chepauk & Santhoshapuram, Chennai.
Medium : Hindi / Tamil
Registered Candidate for Membership
Asia Theological Association (ATA)
Recognised by International Christian Leaders & Senior Pastors for the past 53 years
Certificate in Theology : One year
Diploma in Theology : Two years
Qualification : 10th Standard & above
Rush for admission!
Contact : The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org
✶ ONLINE CLASSES ARE AVAILABLE ✶

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තුති දීම හා ප්‍රසංශා කල යුතු කරුණු

**නොවැ:19**- අපගේ දේවධර්මානුකූල බයිබල් පාඨමාලාවන්හී වර්ධනය සඳහා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:20**- අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක් හවුල්කරුවන්, ඇදහිල්ලේ හවුල්කරුවන්, මහා නියෝගයේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල් සඳහා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:21**- අපගේ මුද්‍රණාලයේ, භාෂා 16 කින් අපගේ සඟරාව මුද්‍රණය කර, ප්‍රකාශයට පත් කිරීමෙන් පසු අදාළ ක්ෂේත්‍ර වෙත යැවීමට අපට හැකිවීම ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:22**- ඔක්තෝබර් මාසයේ, අපගේ සියලු අවශ්‍යතා සපුරාලීම ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:23**- අපගේ රෝහල් සේවයේදී, දෙවියන්වහන්සේ කල ආශ්චර්යයන් ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:24**- අපගේ ප්‍රධාන දේවස්ථානය ශාඛා සභා සහ එය ඇදහිලිවන්තයන් ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:25**- අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ, විදුහල්පති, ගුරුවරු සහ කාර්යය මණ්ඩලය ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:26**- විවිධ සේවාවන් හරහා ශුභාරංචිය ප්‍රචාරය කිරීමට අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැතිවරයාට ඇති කැපවීම ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:27**- අපගේ සභාවට නවක ඇදහිලිවතුන් ලබාදෙන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:28**- අපගේ සංවිධානයට නවක රැකියා ලාභී සේවකයන් එකතුවීම ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:29**- සැප්තැම්බර් 12 වන දින පැවැත්වූ සභා නායක සුහද හමුව ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**නොවැ:30**- සැප්තැම්බර් 30 වන දින වෙපොක් හී පැවැත්වූ ඇදහිලිවතුන්ගේ යාච්ඤා රැස්වීම ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**2022 දෙසැම්බර් මාසය**

**දෙසැ:01**- සභා සේවක පිරිස සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**දෙසැ:02**- අපගේ සහකාර සංස්කාරකවරුන් සහ ඔවුන්ගේ සහයෝගිතාව ගැන දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

**දෙසැ:03**- අපගේ ප්‍රධාන සභාවේ ඉරුදින දේවමෙහෙය සහ අනෙකුත් සේවාවන් ගැනත්, ශාඛා සභා සේවය දුර්ස්ත ස්ථාන වලට පැතිරීම ගැනත් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**දෙසැ:04**- සියලු ජාතීන්ගේ එක්සත්වීම සහ සමාදානය ගැන දෙවියන්වහන්සේට යාච්ඤා කරන්න.

**දෙසැ:05**- ශාන්ත පාවුළු මෙට්‍රිකුලේසන් විදුහලේ සහ නෙහෙමියා බයිබල් විදුහලේ කාර්යය මණ්ඩලය සහ සිසුන් ගැන යාච්ඤා කරන්න.

**දෙසැ:06**- අපගේ කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත් සේවයේ සහකාර සංස්කාරකවරුන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් ගැන යාච්ඤා කරන්න.

**දෙසැ:07**- අපගේ පුවත්පත් කාර්ය මණ්ඩලය සහ මුද්‍රණකරුවන් ඔවුන්ගේ වැඩ කරන වේලාවන් පුරාවටම සුරක්ෂිතව සහ සෞඛ්‍ය සම්පන්නව සිටින ලෙස යාච්ඤා කරන්න.

**දෙසැ:08**- නෙහෙමියා බයිබල් විදුහලේ නේවාසික සිසුන්ගේ නිරෝගි සුවය ගැන යාච්ඤා කරන්න.

**දෙසැ:09**- කැඳවීමේ ප්‍රතිරාවය පුවත්පත හින්දි, කොන්කානි, මනිපුරි යන භාෂාවලින් මුද්‍රණය වන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:10**- අපගේ සංවිධානයට සුදුසු කාර්යය මණ්ඩල සාමාජිකයන් බඳවාගැනීමට යාච්ඤා කරන්න.

**දෙසැ:11**- තරුණ ප්‍රජාව තුළින් සියදිවි නසාගැනීමේ ආත්මය දුරුවෙන පිණිස යාච්ඤා කරන්න.

**දෙසැ:12**- අපගේ ප්‍රධාන පල්ලියේ සහ ශාඛා පල්ලිවල සියලුම සාමාජිකයන් ප්‍රතිලාභ ලැබීම සඳහා යාච්ඤා කරන්න.

**දෙසැ:13**- මේ මාසය පුරාවටම අප සභා අවශ්‍යතා සැපයීම ගැන යාච්ඤා කරන්න.

**දෙසැ:14**- අපගේ පුවත්පතේ සම්බන්ධීකාරක සහ හවුල්කරුවන් වෙනුවෙන් යාච්ඤා කරන්න.

**දෙසැ:15**- අපගේ දේවසේවයේ පුළුල් කිරීම් සහ ලොව පුරා ශුභාරංචිය ප්‍රචාරය කිරීම සඳහා යාච්ඤා කරන්න.

**දෙසැ:16**- ලොව පුරා සිටින කාන්තාවන් සහ දරුවන්ගේ ආරක්ෂාව උදෙසා යාච්ඤා කරන්න.

**දෙසැ:17**- ප්‍රධාන සභා පාළක සෑම් සෙල්වරාජ් ජීවිත කථාව ලියා පලකිරීම ගැන යාච්ඤා කරන්න.

**දෙසැ:18**- ප්‍රධාන සෑම් සෙල්වරාජ් ඇතුළු පවුලේ අයගේ දිව්‍යමය ආරක්ෂාව ගැන යාච්ඤා කරන්න.

4 පිටුවෙන්....

කන්දේ සිට පහලට පැමිණීමට ප්‍රමාද වූ නිසා සෙනඟ ආරොන්ට බල කරමින් රන් වස්සෙක් සාදා එයට නමස්කාර කලේය. මෙය මෝසෙස් දුටු විටදී ඔහුට ඉතා මහත් ලෙස කෝපයට පත් විය. ඔහු දෙවියන්වහන්සේ විසින් දුන්නාවූ ගල්ලෑලි දෙක බිම ගසා කඩා දැමුවේය. අප ස්වර්ගීය හා ආත්මික ආශිර්වාද ලැබීම පමණක් නොව අප භූමික ආශිර්වාදයන්ද ලබා ගත යුතුය. මෙම ආශිර්වාදය සෑම වේදනාව, මානසික ආතතියන් හා දුක ඉවතට දමා දේව ආශිර්වාදය අපට ලැබීමට සලස්වයි. තවද අපට උන්වහන්සේ ලෝකයේ ආශිර්වාදයන්ද ලැබීමට සලස්වයි. මෙම ආශිර්වාදය පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන්ය. අප සැබවින්ම භූමික ආශිර්වාද ලබාගත යුතුයි. මෙම ආශිර්වාදය අපේ සෙනඟට අපගේ දරවැන්ට, අපගේ පවුලට ඉතා අවශ්‍යයි. බොහෝ දෙනෙකුට මෙම ආශිර්වාදය නොමැති නිසා ඔවුන් විවිධ ප්‍රශ්න වලට මුහුණ දෙනු ලබයි. තවත් සමහරු ස්වර්ගීය ආශිර්වාදය පමණක් ඇතැයි කියා භූමික ආශිර්වාද එපා කියා පවසමින් දෙවියන්වහන්සේ දුන් ආශිර්වාදය නැතිකර ගනිති. එම නිසා ඔවුන් වේදනාවෙන් ජීවත්වෙති.

යෝබ් සතුව තිබූ සියලුම භූමික ආශිර්වාදයන් එකම දවසේදී ඔහුට අහිමි විය. ඔහු සතුව තිබූ බැටළුවන් සත්දහසකුත් ඔටුවන් තුන් දහසකුත් ගොන් බාන් පන්සියයකුත් කොටළුදෙනුන් පන්සියයකුත්, වැඩකාරයන් ඉතා මහත් ගණනකුත් එකම දවසේදී නැතිවිය. නමුත් යෝබ් දැනගෙන සිටි කාරණයක් නම්, දෙවියන්වහන්සේට මේ සියල්ල නැවත දීමට හැකි බව. ඔහුට නැතිවූ හැම දේම නැවත ඔහුට ලැබෙන බව ඔහු විශ්වාස කලා. තවද දෙවියන්වහන්සේ ඔහුව අමතක නොකරන බවද ඔහු විශ්වාස කලා. යක්ෂයා විසින් අපට දුන් සෝදිසිය කරණකොටගෙන අපට ලැබුණු භූමික ආශිර්වාදය නැතිවුවත් නැවත අපට එය දෙගුණයක් කර දීමට දෙවියන්වහන්සේට පුළුවනි. ***''මම නුඹට පෙරටුවෙන් ගොස් රළු තැන් සමතලා කොට පිත්තල දොරවල් බිඳ දමා යකඩ අගුල් කපාදමන්නෙමි...අන්ධකාරයේ වස්තුද රහස් තැන්වල නිධානද නුඹට දෙන්නෙමි.....නුඹ මා නැඳින්න නමුත් නුඹට නමක් තිබ්මි.''*** *(යෙසායා 45:2-4)*

***''ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කියන සේක, පළමු ඒවා වැනි ගල්ලෑලි දෙකක් කපාගනින්න, නුඹ විසින් බින්ද පළමු ලෑලිවල තිබුනු වචන ඒ ලෑලිවල ලියන්නෙමි.''*** *(නික්මයාම 34:1)*

ඔබට ලැබුණු භූමික ආශිර්වාදයත් දෙවියන්වහන්සේගේ පොරොන්දුවත් ඔබ, මෝසෙස් ගල්ලෑලි කඩා දැමූ ලෙස කඩා දමා තිබුණත් දෙවියන්වහන්සේට ඒ සෑම දෙයක්ම නැවතත් ලබා දීමට පුළුවන් ඔබ මතක තබා ගන්න. ඇදහිල්ලෙන් ක්‍රියා කරන්න. සැබවින්ම දෙවියන්වහන්සේ ඔබගේ ආශිර්වාදයන් සපයයි.

## (3). පයෝධරවල ආශිර්වාදය

දරුවෙක් ඇතිදැඩි කරන්නාවූ මවක් තුළින් එම දරුවාට පයෝධරවල ආශිර්වාදය ලැබෙන්නේය. යෝසෙප් මෙම පයෝධරවල ආශිර්වාදය ලබා ගත්තේය. 1 රාජාවලිය 4:8 හි



ඉතා ගරුත්වයෙන් කථා කරන්නාවූ ෂූනේම්මිය ස්ත්‍රීය ගැන සඳහන්ව ඇත. ඇය දේව දාසයින්ට උපකාර කිරීම පුරුද්දක් ඇතිව සිටි කාන්තාවකි. ඇය ඇයගේ නිවසේ උඩුමහලක් සාදා දේව දාසයින් එහි නවාතැන් ගැනීමට හැකි ලෙස සකස්කර ඔවුන්ට අවශ්‍ය හැම උපකාරයක්ම කලාය. ***''...මේ සියලු සැලකිලි වලින් නුඹ අප ගැන සැලකුවෙහිය. නුඹ උදෙසා කුමක් කටයුතුද?...''*** *(2 රාජාවලිය 4:13)* මෙයින් අපට පෙනී යන්නේ ඇය දෙවියන්වහන්සේගේ දාසයින්ට ඉතා හොඳින් සැලකූ ආකාරය යේසුස්වහන්සේ උන්වහන්සේගේ ගෝලයින්ට මෙසේ පැවසූ සේක. ***''නුඹලා ක්‍රිස්තුස්වහන්සේට අයිතිය කියා යමෙක් ඒ නාමයෙන් නුඹලාට බොන්ට වතුර කෝප්පයක් දෙන්නේද, ඔහුගේ විපාකය කිසිසේත් නැති නොවන්නේයයි සැබවින් නුඹලාට කියමි.''*** ***(මාර්ක් 9:41)*** දෙවියන්වහන්සේගේ දාසයින් උදෙසා ඔබ කරන්නාවූ සේවය ස්වර්ගයේ දෙවියන්වහන්සේ ඉතා අගය කරන්නේය. දෙවියන්වහන්සේගේ දාසයෝ යනු ඔබගේ පීඩාකාරී වේලාවේදී ඔබගේ ආත්මයටත් ප්‍රාණයටත් අවශ්‍ය නිසි උපකාර කරන්නාවූ පුද්ගලයින්ය. දෙවියන්වහන්සේගේ දාසයෝ ඔබ උදෙසා යාච්ඤා කරනු ලබයි. ඔබ පිළිබඳව වාර්ථාවක් ස්වර්ගයේ දෙවියන්වහන්සේ වෙතට ඔවුන් ඉදිරිපත් කරනු ලබයි. ***''ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය. මට හිඟයක් නොවන්නේය.''*** ***(ගීතාවලිය 23:1)*** එඬේරාගේ අතෙහි ඇති සැරයටියෙන් ගස්වල දළු නමා ඒවා බැටළුවන්ට කෑමට සලස්වයි. පයෝධරවල ආශිර්වාදය යනුවෙන් අදහස්කරනු ලබන්නේ මෙයයි. මවෙක් තම දරුවාට තනපුඩු තුලින් කිරි උරාබීමට සලස්වන්නාක් මෙන් දේව දාසයින් දෙවියන්වහන්සේගේ ආශිර්වාදය ඔබ වෙතට ගෙන එන්නේය. එබැවින් පයෝධරවල ආශිර්වාදය අප දේව දාසයින්ගෙන් ලබාගත යුතුය.

***'...හන්නාට දරුවෝ නොසිටියෝය.''*** *(1 සාමුවෙල් 1:1-2)* ***''ස්වාමීන්වහන්සේ විසින් ඇගේ ගර්භය පියවන ලදී...''*** *(1 සාමුවෙල් 1:6)* මෙම පදයෙන් අපට පැහැදිලි වන්නේ හන්නාගේ ගර්භය වසා තැබුවේ දෙවියන්වහන්සේම බවයි. ඇය දෙවියන්වහන්සේ ඉදිරියේ පොරොන්දුවක් වෙමින් යාච්ඤා කර, ''ඔබගේ මෙහෙකාරීට පිරිමි දරුවෙක් දෙනසේක නම්, ඔහුගේ ජීවිතයේ සැමදාම ඔහු ස්වාමීන්වහන්සේට දෙන්නෙමි'' කියා ප්‍රකාශ කලාය.

1. දරුවෙකු ගර්භයෙහි සෑදීම යනු 'දෙවියන්වහන්සේගේ දර්ශනය අපගේ ජීවිතයට පිළිගැනීම' හා සමානය. මෙය පමණක් වැදගත් වන්නේ නැත.

2. ළදරුවෙක් බිහි වීම අවශ්‍යයි - මෙහි තේරුම නම්, අප දෙවියන්වහන්සේගේ දර්ශනය ලබා එය ක්‍රියාවට නැංවීමයි.

3. බිහිවූ දරුවාව ඔබ වැඩි වර්ධනය කල යුතුයි. එනම් ඔබ දෙවියන්වහන්සේගේ දර්ශනය ලැබූ කල්හි එය ක්‍රියාවට දමා එය ඉතා ඕනෑකමින් ක්‍රියාවට දැමිය යුතුය.

සමහර මවුවරුන් තමාම උපත දුන් දරුවාව විසි කර දමන්නාක් මෙන් අද බොහෝ දේව දාසයින් තමා වෙතට එන අළුත් ආත්ම ගැන සැලකීමක් නොකර ඔවුන්ව අතපසු කර දමති. අප දෙවියන්වහන්සේගේ දර්ශනය අන් අය සමග බෙදාගෙන ඔවුන්ව දෙවියන්වහන්සේ වෙතට රැගෙන ආ පසුව අප ඔවුන් අත් නොහැර ඔවුන්ට ආත්මික ලෙස මඟපෙන්වමින් ඔවුන්ව දේව වචනය තුළින් ගොඩනැගිය යුතුය. උත්පත්ති 21:8 පදයෙහි, ආබ්‍රහම්ට දරුවෙක් ලැබුන විටදී එම දරුවා ටිකෙන් ටික වැඩෙන්නට පටන් ගත් බවයි. එලෙසම දෙවියන්වහන්සේගේ දාසයින් තමා වෙතට පැමිණෙන ආත්ම හැම අතින්ම වැඩි වර්ධනය කල යුතුයි. ඔවුන්ට මගපෙන්විය යුතුය. මවෙක් තම දරුවාට කිරි දී පෝෂණය කරන්නාක් මෙන් දේව දාසයින් තමා වෙතට පැමිණෙන අය හට ආත්මික ආහාර සපයමින් ශුද්ධාත්මයාණන්වහන්සේගේ මගපෙන්වීම තුළින් ඔවුන්ට මඟපෙන්වමින් ඔවුන් දෙවියන්වහන්සේගේ සභාව තුළ ඉතා ශක්තිමත් ලෙස වර්ධනය වීමට උපකාර කල යුතුය. දේව දාසයින් සභාව ඉතාම ස්ථිර ලෙස ගොඩනැගිය යුතුයි. *''...පාතාලයේ දොරටු ඒක පරාජය නොකරන්නේය.'' (මතෙව් 16:18)* දෙවියන්වහන්සේ අපට දුන් සෙනඟ උන්වහන්සේගේ සභාවේ පැළවූ අය ලෙස සිටිය යුතුය. *''ස්වාමීන්ගේ ගෘහයෙහි හිඳුවන ලද්දෝ අපේ දෙවියන්වහන්සේගේ මිදුල්වල සඵලවන්නෝය.'' (ගීතාවලිය 92:13)*

## (4). ගර්භයෙහි ආශිර්වාදය

*''එලීෂා ඒ ගෙදරට පැමිණුන විට ළමයා මැරී තමාගේ ඇඳේ බාවා ඉන්නවා දුටුවේය. එවිට ඔහු ඇතුල්වී ඔවුන් දෙදෙනා සිටිද්දී දොර වසාගෙන ස්වාමීන්වහන්සේට යාච්ඤා කලේය. තවද නැගී ගොස් ළමයා පිට වැතිර තමාගේ කට ඔහුගේ කට පිටද තමාගේ ඇස් ඔහුගේ ඇස් පිටද තමාගේ අත් ඔහුගේ අත් පිටද තබා ළමයා පිට දිගාවුණේය, ළමයාගේ මාංසයද උණුහුම් වුණේය. එවිට ඔහු හැරී ඇවිත් ගෙයි එහා මෙහා වරක් ඇවිද නැවත නැගී ගොස් ඔහු පිට දිගා වුණේය. එවිට ළමයා සත් වරක් කිඹිස ඇස් ඇරියේය.'' (2 රාජාවලිය 4:32-35)*

මෙම ආශිර්වාදය සෙනඟට ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ දාසයින් කරණකොටගෙනය. මවක් ඉතා වේදනාවෙන් යුතුව දරුවෙක්ව මේ ලෝකයට බිහි කරන්නාක් මෙන් දෙවියන්වහන්සේගේ දාසයින් දෙවියන්වහන්සේගේ බලයේ ක්‍රියාව කරණකොටගෙන ශුභාරංචිය ප්‍රකාශ කිරීම හරහා උන්වහන්සේ වෙතට පැමිණෙන සෙනඟව ස්වාමීන්වහන්සේ තුළ වර්ධනය වීමටත් අන් අයව දෙවියන්වහන්සේ වෙතට ගෙන ඒමටත් ඔවුන්ව ධෛර්‍යමත් කිරීමටත් සභාවන් රෝපණය කිරීමටත් මේ ආකාරයෙන් සේවයේ යෙදී සිටියි. මෙය දේව දාසයින්ගේ සේවයෙහි ඉතා වැදගත් කොටසකි. දෙවියන්වහන්සේ ගෙන් දේව දාසයින්ට ලැබෙන්නාවූ අණට කීකරු වී ඔවුන් එයට වහාම කීකරු විය යුතු අතර දෙවියන්වහන්සේගේ වචනයද ඔවුන් ආරක්ෂා කල යුතුයි.

දෙවියන්වහන්සේට සේවය කරන පිණිස අපට කැඳවීමක් ලැබූ විටදී අප පසුබට නොවී එය පිලිගෙන ක්‍රියාකල යුතුය. ඉන්දියාගේ ජනතාව ගැනත්, ඉන්දියානු භාෂාව ගැනත් නොදත් යේසුස්වහන්සේගේ ගෝලයෙක් වූ තෝමස්, ඔහුගේ සිය කැමැත්තෙන්ම ඉන්දියාවට පැමිණ ඉතා මහත් සේවයක් කරනු ලැබුවේය. ඔහුගේ කැපවීමේ සේවය කරණකොටගෙන දෙවියන්වහන්සේගේ මහිමය ඉන්දියාවේ ලක්ෂ 30 කට වැඩි සෙනඟක් වෙතට ගෙන ගොස් ඔවුන්ව දෙවියන්වහන්සේ වෙතට ළඟාකෙරෙව්වේය. මෙම ලක්ෂ 30 න් ලක්ෂ 7 ක් සෙනඟ දෙවියන්වහන්සේගේ කරුණාව කරණකොටගෙන සේවය කළා. මෙලෙස ගැලවීම ලැබූ සෙනඟ සියලුදෙනාම හරියාකාර ලෙස දෙවියන්වහන්සේට සේවය කරනවා නම්, දෙවියන්වහන්සේ වෙතට කොතරම් සෙනඟක් ගෙන ඒමට හැකිද කියා අපට සිතාගැනීමට හැකිය. මේ දේ සිදුවීමට අවශ්‍ය නම්, අප දෙවියන්වහන්සේ

*9 වෙනි පිටුවට ...*

**Echo of His Call Postal Courses for candidates in India only**

**Pray for BIBLECOR**



We offer Postal Course on Basic Truths of The Bible to new Christians and non-Christians in English – 57 pages, Hindi – 76 pages & Tamil – 96 pages. You will get a course book entitled **New Life – For You!** **After the completion of this course, you will get a certificate. There will be no compulsory fees. You will be blessed!**

The Chairman, Nehemiah Bible College, Echo of His Call, Post Box 2957, CHEPAUK, CHENNAI - 600 005.

Ph.: (044) 2852 8282, 2852 9293, 2854 7766, Cell : 98410 71852, 95661 31858 E.mail : biblecor@yahoo.co.in



# PIT TO PALACE

## පාලු වලකින් මාලිගාවට

**"...කියවන්නා තේරුම් ගනීවා...."** *(මතෙව් 24:15)*

# දෙවියන්වහන්සේ අපට සෑහෙයි

## GOD IS SUFFICIENT!

*...those who seek the Lord shall not lack any good thing.* Psalm 34:10

1969 වන වර්ෂයේ සිට අප කැඳවීම ප්‍රතිරාවය සේවය ආරම්භ කල විටදී අපගේ සේවයට බොහෝ ආර්ථික අවශ්‍යතාවයන් තිබුණි. අපගේ සේවකයින්ට ගෙවීමට, මුද්‍රණාලයේ පත්තර මුද්‍රණය කිරීමට මුද්දර වලට, දුරකථන ඇමතුම්, විදුලි බිල් ගාස්තු, ගොඩනැගිලි සඳහා අවශ්‍ය ගෙවීම්, ප්‍රවාහන පහසුකම් ආදී සියල්ලටම අපට මුදල් අවශ්‍යව තිබුණි.

පුද්ගලිකව පවසනවා නම්, ''මගේ ජීවිතයට ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සෑහෙයි.'' මා කිසිම පුද්ගලයෙකුගේ නිවසට ගොස් හෝ ඔවුන්ගේ කාර්යාලයට වෙතට ගොස් මුදල් ඉල්ලාගෙන නොමැත. ඒවාගේම අද දක්වාම මාගේ මිත්‍රයින්ගෙන් හෝ සාභාවේ සාමාජිකයන්ගෙන් පුරුද්දක් ලෙස මා කිසිම දෙයක් ඉල්ලා නොමැත. මන්ද මාව කැඳවූ දෙවියන්වහන්සේ මට අවශ්‍ය සියල්ලම ඉතා පුදුමාකාර ලෙස මට සපයයි.

***''උන්වහන්සේ සියලුම දේම ඒ ඒ කාලයට සුදුසු ලෙස සලස්වා තිබේ.'' (දේශනාකාරයා 3:11)***

මගේ ජීවිතයේ අවශ්‍යතා තිබෙන්නාවූ සෑම විටම දෙවියන්වහන්සේ මට ඉවසීමෙන් සිටීමටත් යාච්ඤා කිරීමටත් ස්වාමීන්වහන්සේ සමඟ යාච්ඤාව තුලින් ඉතා හොඳ සම්බන්ධතාවයක් පැවැත්වීමටත් නිතරම මා හට ඉගැන්නුවේය. මේ දේ කරණකොටගෙන මා මහත් ආශ්චර්යමත් දේ මගේ ජීවිතයෙහි අත්දුටුවෙමි. මා නොදන්නාවූ බොහෝ අය මට උපකාර කරන පිණිස දෙවියන්වහන්සේ නැගිටෙව්වේය. මා නොදන්නාවූ අය තුලින් බොහෝ අවස්ථාවන් වලදී මටද මගේ පවුලටද ස්වාමීන්වහන්සේ අවශ්‍ය භෝජන ලබා දුන්නේය.

1975 වන වසරේදී අපගේ කැඳවීම ප්‍රතිරාවය සඟරාව මුද්‍රණය කල බාබුජි මුද්‍රණාලය ඉන්දියානු මුදලින් රුපියල් 300 ක මුදලක් ගෙවීමට තිබුණි. එය ගෙවන පිණිස මා අතමුදල් නොතිබුණ නිසා මෙම මුදල ගෙවීමට ප්‍රමාද විය. බ්‍රහස්පතින්දා දිනක මා එම මුද්‍රණාලයේ කළමණාකරුට කථාකොට එම මුදල මා සඳුදා උදේට ගෙවන්නෙමි කියා පැවසුවෙමි. නමුත් එම මුදල ගෙවීම පිණිස මා හට කිසිම මාර්ගයක් හෝ ක්‍රමයක් නොතිබුණි. එම මුදල් මා හට ගෙවීමට නොහැකි වුවහොත් එම මාසෙට අදාල කැඳවීමේ ප්‍රතිරාවය සඟරාය මුද්‍රණය කර බෙදා හැරීමට නොහැකි වෙයි. එම නිසා රාජ්‍ය සේවයත් සමඟ විශාල ප්‍රශ්ණකාරී දේ වලට මුහුණදීමට මා හට සිදුවෙනු ඇත. මා මගේ අවශ්‍යතාවයන් උදෙසා දෙවියන්වහන්සේට කන්නලව් කලෙමි. නමුත් ඉරුදින වන තෙක් ඒ සඳහා මා හට කිසිදු පිළිතුරක් ලැබුනේ නැත.



සඳුදා උදෑසන මා මගේ තැපැල් පෙට්ටිය ඇර බලන විටදී මදුරෙයි අසල තිබෙන්නාවූ නාගාලම්පූර් යන ගමේ සිට මා හට බැංකු ලියවිල්ලක් සමඟ රුපියල් 300 ක මුදල් එවා තිබුණි. එදිනට අවශ්‍ය මුදල මා හට සෑහුනි. මා පොරොන්දු වූ ලෙස එම මුද්‍රණාලයට ගෙවිය යුතු මුදල ගෙවීමට මා හට හැකි විය. ස්වාමීන්වහන්සේට ස්තුති වේවා.

ඊට වසර ගණනාවකට පසුව මා හට මුදල් එවූ තැනැත්තාව බලන පිණිස නාගාලාම්පූර් යන ගමට ගියෙමි. මා ඉතා පුදුමයට පත් වූයේ මට එම මුදල් එවූ මනුෂ්‍යයා ඉතා දුප්පත් සපත්තු මසන්නෙක් වූ නිසාය.

ඔහුද මාව දැකීම ගැන ඉතා සතුටු විය. තවද ඔහු මට පවසමින්, 'එදා බ්‍රහස්පතින්දා දවසේදී මගේ හදවතට

කව්දෝ' කෙනෙක් කථා කරන හඬ මට ඇසුණි. එසේ කථා කරමින් මා ළඟ තිබූ රුපියල් 300 ක මුදල කැඳවීමේ ප්‍රතිරාවය සේවය සඳහා යවන්නය කියා පැවසුවා. එම නිසා මා එ මුදල සිකුරාදා දින කැඳවීමේ ප්‍රතිරාවය සේවය සඳහා එව්වා. ඔබට එය සඳුදා දින ලැබුණා කියා පැවසුවේය.

ස්වාමීවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මගේ ජීවිතය තුළ බොහෝ හාස්කම් සිදු කරයි. අපට ස්ථිරවම ආර්ථික තත්වයක් නොමැති වුවත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අපව නොදන්නාවූ බොහෝ අය තුළින් මගේ සියලු අවශ්‍යතා සපයයි.

ඔව්, අප ගමන්කරන්නාවූ මාර්ගය ඉතාම අමාරු මාර්ගයකි. එසේ වුවත් ස්වාමීන්වහන්සේගේ විශ්වාසන්තකම ගැන සැමදාම මා හට සාක්සි දැරීමට පුළුවනි.

***''ස්වාමීන්වහන්සේ මාගේ එඬේරාය, මට හිඟයක් නොවන්නේය.'' (ගීතාවලිය 23:1) 'නුවණැත්තේ මේ දේ සිතට ගනියි...'' (ගීතාවලිය 107:43)*** ■ ■ ■

***7 පිටුවෙන්....***

ඉදිරියෙහි අවංකව කැපවීමෙන් යුතුව අප අපගේ කැඳවීමට කීකරු වී සේවය කල යුතුය.

(2 රාජාවලිය 4:8) පදය දෙස බලන විටදී, එක්තරා පුත්‍රයෙක් ගොයම් කපමින් සිටි තම පියා ළඟට ගියාය කියා පවසා ඇත. එනම්, දරුවෙක් තම පියා සමඟ වැඩකල යුතුය. එසේම සභාවේ සිටින දෙවියන්වහන්සේගේ දාසයින් සමඟ සභාව තුළ සිටින සෑම සාමාජිකයෙක්ම සේවයක් කල යුතුය. ***''එවිට ඔහු, අනේ මගේ ඔළුව, මගේ ඔළුව යයි තමාගේ පියාට කීය, පියාද, ඔහුගේ මවු ළඟට ඔහු ගෙනියාපන්නැයි තමාගේ වැඩකාරයාට කීවේය.'' (2 රාජාවලිය 4:19)*** මෙම දරුවා අසනීප වූවාක් මෙන් දෙවියන්වහන්සේගේ දාසයන් හා සභා සාමාජිකයන් ඔවුන්ගේ යාච්ඤා ජීවිතයේ, සේවයේ හෝ සභාව තුළින් පැමිණෙන්නාවූ විවිධ ප්‍රශ්න වලට මුහුණ දීමට සිදුවෙනවා ඇත. අප එවැනි ප්‍රශ්ණකාරී දේවල් නොසලකා නොහැරිය යුතුය. මේ පිළිබඳව අප සැලකිලිමත්ව ක්‍රියා කල යුතුයි. මේ ගැන අප නොසැලකුවහොත් ආත්මික මරණයක් සිදුවිය හැකිය. මෙම පදයෙන් අපට දැකීමට හැක්කේ මෙයයි. අපගේ ජීවිතයේ ආත්මික මරණයක් සිදු වුවහොත් අප සභාවට ගොස් දෙවියන්වහන්සේගේ අභිමුඛත්ව තුළින් ආත්මික ප්‍රතිකාර ලබාගත යුතුයි. මන්ද දරුවෙක් අසනීප වූ ටවිදී ඔහු හෝ ඇය තම මව වෙතට යන්නාක් මෙන් අප ආත්මික ලෙස රෝගාතුරු වූ විටදී අප ස්වාමීන්වහන්සේගේ පාමුලට යා යුතුයි. මන්ද අපගේ ආත්මික මව නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

එසකියෙල් 47:3-5 දක්වා ඇති කොටස තුළ අප මෙසේ කියවමු, රියන් 1000 ක් වළලුකර ගැඹුරට ජලයෙහි ඇවිද්දා කියාත් රියන් 1000 ක් දණහිස දක්වා ගැඹුර ජලයෙහි ඇවිද්ද බවත් තවත් රියන් 1000 ක් ඉඟටිය දක්වා ගැඹුරු ජලයෙහි ඇවිද්ද බවත් හා තවත් රියන් 1000 ක් එගොඩට යාමට බැරි පීනා යාමට හැකි තරම් ගැඹුරෙහි ගමන්කලාය කියා පවසයි. මෙහිදී දෙවියන්වහන්සේ පියවරෙන් පියවරට ටිකෙන් ටික ගැඹුරට ගෙන ගියේ ඇයි? එනම්, අපට දෙවියන්වහන්සේ දුන් පළමු දේ තුල අපි හිරියටම ඇවිද ගිය විට ඊළඟ ආශිර්වාදය අපට ලැබෙන්නේය. උන්වහන්සේ මැන තිබෙන්නාවූ ප්‍රමාණයට අප ගමන්කරන විටදී ඊළඟ ආශිර්වාදයට ස්වාමීන්වහන්සේ අපව රැගෙන යන්නේය. අපට දී තිබෙන්නාවූ සභාවේ වගකීම් අප නිසි ලෙස ඉටුකරනවා නම්, දෙවියන්වහන්සේ විසින් සූදානම් කර තිබෙන්නාවූ සෑම ආශිර්වාදයක්ම හා සෑම වර්ධනයක්ම අපට දැකීමට පුළුවන.

ගණන් කථාව 16:36-38 දක්වා ඇති කොටසෙහි අප මෙලෙස කියවමු. ***''ස්වාමීන්වහන්සේ මෝසෙස්ට කථාකොට ධූප භාජණ ශුද්ධ නිසා ඒවා ගිනි මැදින් ගෙනෙන්ට පූජකවූ ආරෝන්ගේ පුත්‍රයා වන එලෙයාසර්ට කියාපන්න, එහි ගින්න අහසට විසුරුවා දමාපන්න, තමුන්ගේම ප්‍රශ්නවලට විරුද්ධ වුණ මේ පව්කාරයන්ගේ ධූප භාජනවලින් පූජාසනය වැඩීමට තලාපු තහඩු සාදනු ලැබේවා. ඔවුන් ඒවා ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි ඔප්පු කළ බැවින් ඒවා ශුද්ධය. ඉශ්‍රායෙල් පුත්‍රයන්ට ලකුණක් පිනිස වන්නේයයි කීසේක.''***

කූඩාරම ඇතුලතෙහි ගිවිසුම් පෙට්ටියත් අල්තාරය මත රන් පහන් රුකද එකම ස්ථානයක තිබිය යුතුය. නමුත් දුම් කබල පූජකයාගේ අතෙහි තිබිය යුතුය. ඔහු පූජාසනයට යන හැම විටම ඔහුගේ අතේ දුම් කබල තිබිය යුතුය. එම දුම් කබල අනවශ්‍ය ස්ථානවල නොතබා ශුද්ධස්ථානය මතම තැබිය යුතුය. මෙම දුම් කබල සෑදිය යුත්තේ තලාපු තහඩු වලිනි. අපගේ ආත්මික වර්ධනය ස්වර්ගය දක්වා යා යුතුයි. එය අතරමග නතර කල නොහැකිය. අප ආත්මික ලෙස යම් ස්ථානයකට වර්ධනය වූ විට එයින් සෑහිමකට පත් නොවී දිගටම වර්ධනය වීම සිදු විය යුතුය. අපගේ ආත්මික වර්ධනය ස්වාමීන්වහන්සේට ප්‍රේම කිරීමටත් එය අප ස්වාමීන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වන තෙක්ම නොකඩවාම කල යුතු දෙයක්ව ඇත.

2 රාජාවලිය 4:21-35, දක්වා ඇති කොටසෙහි අපට මෙසේ දැකිය හැකිය. මැරුණු දරුවෙක් කොටළුවෙක්, දාසයෙක්, මවක්, දෙවියන්වහන්සේගේ දාසයෙක් සහ ඔවුන්ගේ ගෝලයෙක් ලෙසයි. මෙම පස් දෙනාම ධර්මදූත සේවකයින්, අපෝස්තුළුවරුන්, ප්‍රොපේතවරුන්, පාලකවරුන් හා ගුරුවරුන් යනුවෙන් අපට සමාන කිරීමට හැකිය. ගර්භයේ ආශිර්වාදය අපට දීමට හැකි අය නම් මොවුන්ය. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යා වන එළීෂා ළඟට පුද්ගලයින් තුන්දෙනෙක් ගිය අතර හතරවෙනියා නම්, ගෙහාසිය. ඔහු ප්‍රොපේත එළීෂාගේ උපකාර දාසයෙකි. ඔහු එළීෂාගේ සැරයටිය මැරුණු දරුවා මත තැබූවත් දරුවා නැගිට්ටේ නැත. එම නිසා මෙම මැරුණු දරුවා එළීෂා වෙතට රැගෙන එන ලදී.

***''එළීෂා එම ගෙදරට පැමිණුන විට ළමයා මැරී තමාගේ ඇඳ බාවා ඉන්නවා දුටුවේය. එවිට ඔහු ඇතුල්වී ඔවුන් දෙදෙනා සිටිද්දී දොර වසාගෙන***

RNI NO. TN/SIH/2006/17846

*ස්වාමීන්වහන්සේට යාච්ඤා කලේය. තවද නැගී ගොස් ළමයා පිට වැතර තමාගේ කට ඔහුගේ කට පිටද තමාගේ ඇස් ඔහුගේ ඇස් පිටද තමාගේ අත් ඔහුගේ අත් පිටද තබා ළමයා පිට දිගාවුණේය, ළමයාගේ මාංසයද උණුහුම් වුණේය. එවිට ඔහු හැරී ඇවිත් ගෙයි එහා මෙහා වරක් ඇවිද නැවත නැගී ගොස් ඔහු පිට දිගා වුණේය. එවිට ළමයා සත් වරක් කිඹිස ඇස් ඇරියේය.'' (2 රාජාවලිය 4:32-35)*

මෙම මැරුණු දරුවාව නැගිටුවන පිණිස එලීෂා බොහෝ ක්‍රම පාවිච්චි කරනු ලැබීය. ඔහු එහාට මෙහාට ඇවිද අවසානයේදී මෙම දරුවා ජීවමාන තත්වයට පැමිණුනේය. එනම් මවක් දරුවෙක්ව බිහි කිරීමට මහත් වේදනාවක් දරමින් හා බොහෝ ක්‍රියාවන් තුළින් යන්නාක් මෙන් දේව දාසයෝත් වේදනාව හා බොහෝ ක්‍රමයන් අනුගමනය කරමින් ආත්මික ලෙස සෙනඟව විනාශ නොකර ඔවුන්ව ආත්මික ලෙස ගොඩනැගිය යුතුය.

දෙවියන්වහන්සේගේ දාසයා සත් වරක් දරුවා පිට වැතුරුනාය. මෙයින් අදහස් වන්නේ, එම දරුවාගේ හුස්ම හිරවී තිබූ අතර නැවත හුස්ම පැමිණුනාක් මෙන් අප දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයන් හැටියට අමාරු දේ කරමින් මනුෂ්‍යයන්ට ආශිර්වාදය උපදවන පිණිස ක්‍රියා කල යුතුය. මේ ආකාරයට ගර්භයේ ආශිර්වාදය අපට මනුෂ්‍යයන්ට දීමට හැකිය.

************

## කැඳවීමේ ප්‍රතිරාවය

සෑම මසකම භාෂා 16 කින් නිකුත් වන සඟරාව, බයිබල් විද්‍යාලය, තැපැල් මාර්ගික බයිබල් පාඩම් මාලාව, සභා රෝපණය, පාසැල් අධ්‍යාපනික සේවය, සුභාරංචි රැස්වීම් මාලා, සම්මේලනය පැවැත්වීම ආදිය.

| | |
|---|---|
| වාර්ෂික දායකත්වය - රු. 100/- | ජීවිත දායකත්වය - රු. 2000/- |

කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ විවිධාකාර සේවාවන් අප පවත්වාගෙන යනු ලබන්නේ ඔබගේ උපකාරයන් හා ස්වේච්ඡාවෙන් ඔබ දෙන සම්මාදන් හා දීමනා කරුණාකොටගෙනය. ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වන්නාවූ ආකාරයෙන් කැඳවීමේ ප්‍රතිරාවය සේවයට උපකාර කිරීමට ඔබටද හැකිය. ඔබ දෙන්නාවූ උපකාර කරුණාකොට ගෙන දෙවියන්වහන්සේව නොදන්නාවූ සෙනඟට සුභාරංචිය ප්‍රකාශ කිරීමට උපකාර වෙනවා ඇත.

ඔබට මෙම සඟරාව අවශ්‍ය නම්, කරුණාකර අපට දන්වා එවන්න. ඔබගේ ඊ-මේල් ලිපිනය හා දුරකථන අංකයද, එසේම ඔබගේ ලිපිනය වෙනස් කරනවා නම් එම වෙනස් වූ ලිපිනයද අපට දන්වා එවන්න.

අපගේ වෙබ් අඩවියට ගොස් මෙම භාෂා 16 කින් ඇති සඟරාවන් බලා ගැනීමට ඔබට හැකිවනු ඇත. ඔබගේ ලිපි, යාච්ඤා ඉල්ලීම් සහ ඔබගේ උපකාරයන් පහත ලිපිනයට අප වෙත එවන්න.

කරුණාකර ඔබගේ දුරකථන අංකය, ජංගම දුරකථන අංකය හා ලිපිනය අප වෙත එවන්න.

**ECHO OF HIS CALL**
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA
PH: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98412 71858, 98410 71852
E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in
Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.com

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**
**Date of Publication: First week of every month**
**Date of Posting : 1st & 2nd of every month**
**Posted at "Egmore RMS / 1 Patrika Channel"**
**on 2nd NOVEMBER 2022.**
**If un-delivered please return to:**
**ECHO OF HIS CALL (SINHALA)**
**P.O. Box No. 2957,**
**Chepauk, Chennai - 600 005, INDIA.**
**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

**JESUS LOVES YOU!**

**To**

**GOD BLESS YOU!**

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by him at **Echo of His Call Printers**, New No. 8 & 10, Old No. 18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**